තන්හා, ආශාවන්ගෙන් අපා ගින්න වට වී ඇත. විපත්තිවලින් ස්වර්ගය වට වී ඇත

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්රකාශ කළ බව
අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. "තන්හා,
ආශාවන්ගෙන් අපා ගින්න වට වී ඇත. විපත්තිවලින් ස්වර්ගය වට වී ඇත."
[صحيح] [رواه البخاري]

සැබැවින්ම නිරය මනස ආශා කරන තහනම් කටයුතුවලින් හා අනිවාර්යය කටයුතුවල සිදුවන අඩුපාඩුකම්වලින් වට වී ඇති බව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් පැහැදිලි කර සිටියි. කවරෙකු තම මනස ආශා කරන දෑ පිළිපදින්නේ ද ඔහුට අපා ගින්න නියම වේ. එමෙන්ම ස්වර්ගය, නියම කර ඇති දෑහි අඛණ්ඩව නිරත වීම, තහනම් දෑ අත්හැර දැමීම හා ඒවා කෙරෙහි ඉවසීම යනා දී ආත්මය පිළිකුල් කරන කරුණුවලින් වට වී ඇති බවත් පැහැදිලි කර සිටියි. කවරෙකු ඒවා තරයේ පිළිපදිමින් තම ආත්මය ඒ වෙනුවෙන් කැප කරන්නේ ද ඔහු ස්වර්ගයට පිවිසීම අනිවාර්යය වේ.

http://www.sunnah.global/hadeeth/si/show/3702